14726

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) විවාදී ස්වර ලෙස රි ග ම් ධ නි යන ස්වර යොදා ගන්නා රාගය කුමක් ද?
(1) කාෆි (2) භෛරවී (3) යමන් (4) භූපාලි

(02) කිසියම් රාගයකට අදාලව ලක්ෂණ ඇතුලත් කරමින්, තාලයකට අනුව, ප්‍රබන්ධ කර ඇති ගීත ශෛලිය වන්නේ,
(1) සර්ගම් (2) ඛ්‍යාල් (3) ලක්ෂණ ගී (4) ස්වර ස්ථාපන ගී

(03) "අභිනව මූලික ගීත" නම් ග්‍රන්ථය රචනා කලේ,
(1) ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා ය. (2) වින්සන්ට් සෝමපාල මහතා ය.
(3) ආනන්ද ජයසිංහ මහතා ය. (4) එම්. ජී. පෙරේරා මහතා ය.

(04) නි ධ නි රි ස, නි ධ නි රි ග රි ස ............ යන ස්වර අභ්‍යාසයේ යමන් රාගයට අනුව ඊළඟ පියවරට අදාළ ස්වර ඛණ්ඩය වන්නේ,
(1) නි ධ නි රි ග ම ග රි ස (2) නි ධ නි රි ග ම් ග රි ස
(3) නි ධ නි රි ග ප ග රි ස (4) නි ධ නි රි ග ප ම ග රි ස

(05) භෛරවී සහ යමන් රාග යුගලය සඳහා පොදුවේ අදාල වන කරුණ තෝරන්න.
(1) වාදී සංවාදී සමාන වේ. (2) සංවාදී ස්වරය සමාන වේ.
(3) එකම මේලයකට අයත් වේ. (4) සම්පූර්ණ ජාතියට අයත් වේ.

(06) ස්වර සප්තකය තුල ඇති අර්ධ ස්වර පරතරයක් සහිත ස්වර යුගලය තෝරන්න.
(1) නි ධ (2) ප ම (3) ම ග (4) රි ස

(07) පහත ප්‍රකාශ වලින් විස්තර කෙරෙන ගායන ශෛලිය කුමක් ද?
- ස්වර පමණක් යොදා ගැනීම.
- තාලානුකූලව ප්‍රබන්ධ කර තිබීම.
- රාග සංගති අන්තර්ගත වීම.

(1) ඛ්‍යාල් (2) සර්ගම් (3) මධ්‍යාලය ගී (4) ලක්ෂණ ගී.

(08) නි ස ගු ම ප ධු ප ...... යන ස්වර සංගතිය අයත් රාගය වන්නේ,
(1) භෛරවී (2) භූපාලි (3) කාෆි (4) යමන්

(09) |ස - ග ම| ප - - -| ·//. |

ඉහත ප්‍රස්තාර කොටසේ තෙවන විභාගයේ දැක්වෙන සංකේතයෙන් අදහස් කරනුයේ,

(1) තෙවන විභාගය නිහඬව සිටිය යුතු බවයි.

(2) දෙවන විභාගයේ ස්වර නැවත වාදනය කළ යුතු බවයි.

(3) මුල් විභාග දෙකේම ඇතුළත් ස්වර නැවත වාදනය කළ යුතු බවයි.

(4) මුල් විභාගයේ ස්වර නැවත වාදනය කළ යුතු බවයි.

(10) |ග - ම| ප - ග| ම - ග | රි - - |

ඉහත ස්වර පාදය හා සුසංගත වන ස්වර පාදය කුමක් ද?

(1) |ස - රි | ග - ම| රි - ස | ස - -|
(2) |ප - ධ | නි - ප| ධ - ප | ම - -|
(3) |රි - ග | ම - රි| ප - ම | ග - -|
(4) |ම - ප | ධ - ම| ප - ම | ග - -|

(11) ගීත තැටිගත කිරීමේ තාක්ෂණයේ ආරම්භක පියවර වනුයේ,

(1) CD තැටිය යි.
(2) ග්‍රැමෆෝන් තැටිය යි.
(3) DVD තැටිය යි.
(4) VCD තැටිය යි.

(12) ගුවන් විදුලි සරල ගීයට මුල් අත්තිවාරම සකසනු ලැබූ සංගීතඥයකු වන්නේ,

(1) ඩබ්ලිව් ඩී. අමරදේව මහතා
(2) ආර්. ඒ. චන්ද්‍රසේන මහතා
(3) පී. එල්. ඒ. සෝමපාල මහතා
(4) ආනන්ද සමරකෝන් මහතා

(13) |× × | × × ×| මෙම රිද්ම රටාව දැක්වීමට බටහිර සංගීතයේ යෙදෙන Time Signature කුමක් ද?

(1) $5_8$ (2) $2_3$ (3) $2_4$ (4) $3_4$

(14) ස්වර මාලිකා යනු,

(1) ලක්ෂණ ගී වේ. (2) ඛ්‍යාල් වේ. (3) සර්ගම් වේ. (4) පල්ටා වේ.

(15) දිවා දෙවන ප්‍රහාරය යනු දවසේ කුමන කාල පරාසය ද?

(1) ප. ව. 9. 00 - 12.00
(2) පෙ. ව. 6.00 - 9.00
(3) පෙ. ව. 9.00 - 12.00
(4) ප. ව. 6. 00 - 9.00

(16) සප්තක තුනම ඇසුරු කර ඇති ස්වර ඛණ්ඩය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප̣ නි̣ රි ම ප නි ස̇
(2) ප̣ ධ̣ නි̣ ස රි ග ම
(3) ස ග ම ප ධ නි ස̇
(4) රි ග ම ප ධ නි ස̇

(17) භෛරවී රාගය ඇසුරෙන් තනු නිර්මාණය වූ ග්‍රැමෆෝන් ගීතය කුමක් ද?

(1) මහබෝධි මූලේ....

(2) එන්න මද නලේ....

(3) කවුරුදෝ අර කවුළුවෙන්....

(4) සුපිපුණු සුගන්ධයුත්....

(18) මව්පියො ආදී සොඳුරු තමාගේ.., බැස සීතල ගඟුලේ..., සිරි බුද්ධගයා විහාරේ වැනි ගීත වර්ග කළ හැකි වන්නේ,

(1) නාඩගම් ගී (2) නූර්ති ගී (3) නව නාට්‍ය ගී (4) ග්‍රැමෆෝන් ගී

(19) එක් විකෘති ස්වරයක් පමණක් යෙදෙන රාගය කුමක් ද?
(1) බිලාවල් (2) යමන් (3) කාෆි (4) භෛරවී

(20) පැහැසරණිය මිණි පැමිණිය... නම් ගීතය,
(1) දෙතිස්මත් සේ ගීයකි.
(2) ආඝාතාත්මක සේ ගීයකි.
(3) අනාඝාතාත්මක සේ ගීයකි.
(4) දොළොස්මත් සේ ගීයකි.

(21) පහත සඳහන් ගීත අතරින් සොළොස්මත් සේ ගීයක් ලෙස සැලකිය හැකි ගී පාදය තෝරන්න.
(1) රූ රැසේ අඳිනා ලෙසේ....
(2) රුගත් සුරා පිරූ විතින්....
(3) සඳවා සුදුවැලි පිවිතුරු....
(4) මත්මත් කරවන.....

(22) මෙහෙ ගී, බැති ගී, සමාජයීය ගී මේ සියල්ල හැඳින්විය හැකි පොදු නාමය කුමක් ද?
(1) ගැමි ගී (2) සේ ගී (3) ජන ගී (4) අනාඝාතාත්මක ගී

(23) ගීතය ගායනයේ දී වඩාත් හොඳින් හැඟීම් ප්‍රකාශනය සිදු කළ හැකි ගීත විශේෂය දක්වෙන පිළිතුර තෝරන්න.
(1) සමාජයීය ගී
(2) අනාඝාතාත්මක මෙහෙ ගී
(3) කෙළි ගී
(4) ආඝාතාත්මක මෙහෙ ගී

(24) නාඩගම් ගීතයක නාද මාලාව ඍජුවම දකගත හැකි නව නාට්‍ය ගීතය තෝරන්න.
(1) මෑ වේ මා දුටු කොමළ ලියා
(2) ගල්ලෙන බිඳලා...
(3) ප්‍රේමයෙන් මන රංජිත වේ.
(4) අම්බරයේ සඳ සේ දිලේ...

(25) "ස" ස්වරය හා "රි" ස්වරය එකිනෙක වෙනස් වේ. එය නාදයේ කුමන ගුණය ද?
(1) තාරතාවය (2) විපුලතාවය (3) ධ්වනි ගුණය (4) හඬේ සැර

(26) තත් භාණ්ඩයක එක ම ස්වරයක් පෙළීමේ බර අඩු වැඩි කරමින් වාදනය කරන විට නාදතරංගයේ යම් වෙනසක් සිදුවේ. එම වෙනස දැකිය හැක්කේ,
(1) තරංගයේ හැඩයේ ය.
(2) තරංග ආයාමයේ ය.
(3) තරංග සංඛ්‍යාතයේ ය.
(4) තරංග විස්තාරයේ ය.

(27) සිතාරයෙන් හා එස්රාජයෙන් නිකුත් වන නාදය එකිනෙකට වෙනස් ය. මෙය නාදයේ,
(1) විපුල තාවය යි.
(2) ධ්වනි ගුණය යි.
(3) තාරතාවය යි.
(4) විස්තාරය යි.

- **පහත සඳහන් ගී පාදය ඇසුරෙන් ප්‍රශ්න අංක 28 - 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| ස ඳ ක් | සේ ऽ ඔ බ | එ ළි ය | දෙ නු මැ න |

(28) ඉහත සඳහන් ගී පාදය සඳහා වාදනය කළ යුතු තාලය කුමක් ද?
(1) ත්‍රිතාලය
(2) ජප් තාලය
(3) දීප්චන්දි තාලය
(4) කෙහෙර්වා තාලය

(29) එම තාලයේ බලි ස්ථානය පිහිටා ඇත්තේ,
(1) හතරවන මාත්‍රාව මතය.
(2) අටවන මාත්‍රාව මතය
(3) පස්වන මාත්‍රාව මතය.
(4) නව වන මාත්‍රාව මතය

(30) එම තාලයට අනුව ගැයෙන සරල ගීතය තෝරන්න.

(1) සැදෑ කළුවර.... (2) රන්වන් කරල් සැලෙයි...

(3) මිහිකත නලවාලා.... (4) බැස සීතල ගඟුලේ...

• ජන සංගීත ක්ෂේත්‍රයේ උන්නතියට දායක වූ සංගීතඥයින් සිව් දෙනෙකු පහත දක්වේ ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක 31 සිට 33 දක්වා පිළිතුරු සපයන්න.

A



B



C



D



(31) 'ලංකාවේ සංගීත සම්භවය' කෘතිය රචනා කරන ලද සංගීතඥයා දක්වෙන අක්ෂරය වනුයේ,

(1) A (2) B (3) C (4) D

(32) "මේ අවුරුදු කාලේ...", "මල්සරා බැල්ම හෙලා" යන ගී නිර්මාණය සඳහා දායක වූ සංගීතඥයින් දෙදෙනා තෝරන්න.

(1) A හා B (2) C හා D (3) B හා D (4) A හා C

(33) ජන නාද රටා ඇසුරින් "දෙපානෝ" ගීත නාටකය නිර්මාණය කරන ලද සංගීතඥයා කවු ද?

(1) A (2) B (3) C (4) D

(34) පැරණි කාව්‍ය ග්‍රන්ථයකින් උපුටා ගත් කවියක්, ගීතයක් වූ අවස්ථාව මින් කුමක් ද?

(1) රුක් අත්තන මල මුදුනේ... (2) රූ රැසේ අඳිනා ලෙසේ අත්...

(3) දෑතට වළළු... (4) කඳුළු හෙලා නැඹිලියට....

(35) රිද්මයට අනුව නර්තනයේ යෙදෙමින් වින්දනාත්මකව ගයනු ලබන ගීත විශේෂය මින් කුමක් ද?

(1) චිත්‍රපට ගී (2) සරල ගී (3) කපිරිඤ්ඤා ගී (4) ග්‍රැමෆෝන් ගී

(36) හින්දි චිත්‍රපට ගීත අතරින් තෙරේ මේරේ... ගීතය අයත් චිත්‍රපටය කුමක් ද?

(1) අභිමාන් (2) ජනක් ජනක් පායල්

(3) බයිජුබව්රා (4) මධුමතී

(37) අවග්‍රහයෙන් හා විෂමග්‍රහයෙන් ගායනා කළ හැකි ගී පාද පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ,

(1) මිහිකත නලවාලා.../ මධුර යාමෙ....

(2) මධුර යාමේ..../ කවාලා විළඳ ජාතී....

(3) මේ සිංහල අපගෙ.... / දුනුකෙයියා මලක් වගේ ....

(4) අයන්න කියන්න..../ සසර වසන තුරු....

(38) සංගීතය පටිගත කිරීම සඳහා යොදාගත හැකි පරිගණක මෘදුකාංගයක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) Sound Forge (2) Adobe Audition

(3) Acid Pro (4) Reason

(39) කායදා, පල්ටා, පරන්, තිහායි, රේලා ආදී කොටස් වාදනය දැකගත හැකි වන්නේ,

(1) ශාස්ත්‍රීය තබ්ලා වාදනයක දී
(2) ශාස්ත්‍රීය සිතාර් වාදනයක දී
(3) ශාස්ත්‍රීය වයලීන් වාදනයක දී
(4) ශාස්ත්‍රීය බටනලා වාදනයක දී

(40) භාරතීය සංගීතයේ ගසල් ගායනයේ සුප්‍රසිද්ධ සංගීතඥයකු වන්නේ,

(1) ඒ. ආර්. රහුමාන්
(2) ජග්ජිත් සිං
(3) හරිප්‍රසාද් චෞරසියා
(4) ශබීර් හුසේන්

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(I) තීව්‍ර මධ්‍යමය යෙදෙන නිර්දේශිත රාගය කුමක් ද?

(II) තබ්ලාවේ කොටස් දෙක නම් කරන්න.

(III) 'ආලෙ බැන්ද මාගේ රම්‍යවත්' ගීතය ඇතුළත් නාට්‍යය කුමක් ද?

(IV) ස්වර දොළහම යොදාගත හැකි රාගය කුමක් ද?

(V) | × - | × - - | මෙම රිද්මයට වැයෙන හින්දුස්ථානි තාලය නම් කරන්න.

(VI) හරිප්‍රසාද් චෞරසියා සුප්‍රසිද්ධ වී ඇත්තේ කුමන භාණ්ඩය සම්බන්ධව ද?

(VII) මධ්‍ය ගාන්ධාරයේ සංඛ්‍යාතය 320 නම් උච්ච ගාන්ධාරයේ සංඛ්‍යාතය කීයද?

(VIII) පරිගනකය ඇසුරින් සංගීතය නිර්මාණය කිරීමේදී භාවිත කළ හැකි මෘදුකාංගයක් නම් කරන්න. (ලකුණු 08)

- **(ix)** හා **(x)** ප්‍රශ්නවල පිළිතුරු සඳහා වරහන් තුළ ඇති වචන උපයෝගී කර ගන්න.
  (විෂම, වැළපුම් ගී, ග්‍රැමෆෝන් , රාගාශ්‍රිතව)

(IX) දුර පෙනෙන තැනිතලා ගීතය ............................. ග්‍රහයෙන් ගැයෙන ......................... ගීතයකි.

(X) කඳුළු හෙලා නෑඹිලියට ගීතය ............................. නාද රටාව ඇසුරෙන් නිර්මාණය වී ඇති අතර නැති බැරි මොහොතට ගීතය ............................. නිර්මාණය වී ඇත. (ලකුණු 04)

(02) (I) පහත දැක්වෙන වගුව ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා හිස්තැන්වලට අදාළ පිළිතුරු සපයන්න.

| රාගය | මේලය | වාදී | සංවාදී | ආරෝහණ | අවරෝහණ | රාග සංගති |
|---|---|---|---|---|---|---|
| භෛරවී | භෛරවී | ........ | ස | ...................... | ...................... | ...................... |
| යමන් | ............. | ග | ........ | ...................... | සංනිධපම්ගරිස | ...................... |

(ලකුණු 04)

(II) ඉහත වගුවේ සඳහන් රාග දෙකෙන් එකක මධ්‍යලය ගීතයක හෝ ලක්ෂණ ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසක් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(III) එම ගීතය ගැයෙන තාලය, තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(03) පහත සඳහන් කායදාව ඇසුරු කරගනිමින් පිළිතුරු සපයන්න.

| ගෙ ගෙ ති ට | ති ට ති ට | ධා ධා ති ට | ධා ධා තූ නා |

(I) කායදාවේ තබ්ලා අක්ෂර පහත සඳහන් පරිදි වෙන් කරන්න.

බායාවෙන් පමණක් නිකුත් වන අක්ෂර - ..............................

දායාවෙන් පමණක් නිකුත් වන අක්ෂර - ..............................

(ලකුණු 05)

(II) පහත සඳහන් අක්ෂර නිර්මාණය සඳහා එකවර වාදනය කළයුතු අක්ෂර 02 ලියන්න.

ධිං = .................... + ....................

ධි = .................... + ....................

ධා = .................... + .................... (ලකුණු 03)

(III) පහත (a) යටතේ ඇති අක්ෂර පමණක් යෙදෙන තාල දෙකක් ද, (b) යටතේ ඇති අක්ෂර පමණක් යෙදෙන තාල දෙකක් ද නම් කරන්න.

(a) ධ, ධිං, ත, තිං

(I) ..............................

(II) ..............................

(b) ධ, ධි, න, ති, ගෙ, ක

(I) ..............................

(II) .............................. (ලකුණු 1 × 4 = 04)

(04) (I) ජන ගී ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ගී පාදය | ගී විශේෂය | ආසාතාත්මක අනාසාතාත්මක බව | ඒ ගී විශේෂයට අයත් වෙනත් ගී පාදයක් | ගී නිර්මාණයට හේතු වූ සාධක |
|---|---|---|---|---|---|
| (A) | දොඩම් කපාලා ඇඹුල් තනාලා..... | කෙළි ගී | | | |
| (B) | දඩි බිඩි ගගා කරනා වැඩ..... රටවටියේ..... | | | | |
| (C) | බෝගම්බර අපි නෙළුමට යනකොට | | | ඉපල් පිටින් ගහන අව්ව | |
| (D) | සම්මා සම්බුදු වෙනමුණි රජුනේ.... | | | | භක්තිය දැනවීම, ඇදහිලි, විශ්වාස |
| (E) | දෝයි අම්මා දෝයි දොයි දොයියෝ.... | | ආසාතාත්මක | | |

(ලකුණු 1/2 × 16 = 08)

(II) "රැගත් සුරා පිරූ විතින්...." ගුත්තිල කාව්‍යයේ එන මෙම පැදියේ මුල් පාද දෙක ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(05)

| A | B | C |
|---|---|---|
| පිට දීප දේශ ජය ගත්තා... | ඕලු පිපීලා.... | තු ගංගා කී මෞජ මෛං |
| බැස සීතල ගඟුලේ... | එන්නද මැණිකේ.... | ජනක ජනක පායල් භාජේ.. |

(I) ඉහත වගුවේ A, B, C අක්ෂර යටතේ දක්වා ඇති ගීත විශේෂයන් ඔබ නම් කරන්නේ කෙසේ ද? (ලකුණු 03)

(II) A අක්ෂරය යටතේ ඇති ගීත වල ලක්ෂණ 4ක් ලියන්න. (ලකුණු 04)

(III) B අක්ෂරය යටතේ ඇති ගීත වල ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(IV) C අක්ෂරය යටතේ ඇති ගීත දෙකේ තනු නිර්මාණයට පාදක වූ රාග දෙක නම් කරන්න. (ලකුණු 02)

(06) (I) (අ) කොටසේ දැක්වෙන ගී පාදය හා සම්බන්ධ ප්‍රකාශය (ආ) කොටසින් තෝරා අදාල අක්ෂරය යටතේ ලියා දක්වන්න.

(අ) | (ආ)

(A) | ප ප ස ස | නි නි ස ස | ප ප ස ස | නි නි ස ස |
| ද කු ණ නැ | ගෙ න හි ර | බ ට හි ර | උ තු ර ද | — දීප්චන්දි තාලයෙන් ගැයෙන ගී පාදයකි

(B) | සග- මප- | ගප- ගස- | සග- මප- | ග-ස සසස |
| පිපී s පිපී s | | පිපීs පිපීs | රේsණු නටන | — මධ්‍යම භාවයෙන් ලියූ ස්වර පාදයකි

(C) + ධ නි | ස් - ධ | නි ස් රි | ස් ධ - | - - - |
+ දු ර | පේ s න | තැ නි ත | ලා s s | s s s | — Bit නමින් හැඳින්වෙන කොටසක් ඇත.

(D) | ස - ස | ස - ස රි | ම — ම | ම — ම ප | ධ —
| ර න් ම | ල ක් ලෙ ස | දෙ ව් බ | ඹු න් දෝ s | ති න් — ⁒ සංකේතය යෙදිය හැකි ස්වර පාදයකි

(ලකුණු 2 X 4 = 08)

(II) ඉහත A, B, C, D පාද වල Time Signature ලියා දක්වන්න. (ලකුණු 04)

(07) පහත සඳහන් මාතෘකා අතුරින් <u>තුනක්</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න. (උදාහරණ සහිතව කරුණු හතරක් ප්‍රමාණවත් වේ.)

(I) විපුලතාවය

(II) සේ ගී

(III) සංගීතය සඳහා පරිඝනක භාවිතය

(IV) කපිරිඤ්ඤා සංගීතය

(ලකුණු 4 X 3 = 12)